# ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය
## விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகார அமைச்சு
## Ministry of Sports and Youth Affairs

නො.09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07. இல. 09, பிலிப் குணவர்த்தன மாவத்தை, கொழும்பு 07. No.09, Philip GunawardanaMawatha, Colombo 07.

මගේ අංකය / எனது இல / My No. MS/4/1/11

ඔබේ අංකය / உமது இல / My No.

දිනය / திகதி / Date 2020.06.16

සභාපති/ ලේකම්

සියළුම ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන

**<u>වෘත්තීයමය ක්‍රීඩා පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන.</u>**

මෙම අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ශ්‍රී ලංකාවේ වෘත්තීමය ක්‍රීඩා පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කර ඔවුන් ලියාපදිංචි කිරීමේ වැඩසටහනක් 2014 වර්ෂයේ සිට ආරම්භ කොට මේ දක්වා ක්‍රියාත්මක කරනු ලබයි.

02. මෙම වැඩසටහන යටතේ වෘත්තීයමය ක්‍රීඩා පුහුණුකරුවන් විධිමත්ව ලියාපදිංචිකර "ලියාපදිංචි ක්‍රීඩා පුහුණුකරුවන්ගේ ජාතික ලැයිස්තුව" සකස්කිරීමට යෝජිතව ඇත. මෙහිදී විධිමත් පුහුණුවකින් පසුව අදාල පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම සිදුකරනු ලබන අතර වසර දෙකකට වරක් දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහනක් යටතේ එම ලියාපදිංචිය අලුත් කරනු ලැබේ .

03. මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි වන පුහුණුකරුවන් සඳහා "බලපත්‍රලාභී පුහුණුකරු හැඳුනුම්පත" නිකුත් කරනු ලබන අතර එම බලපත්‍රය ක්‍රීඩා පනත මඟින් නීතිගත කොට 2022.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ අනුව, ඉදිරියේදී යම් අයෙකු ක්‍රීඩා පුහුණුකරුවකු ලෙස කටයුතු කරන්නේ නම් එදිනට බලපත්‍රලාභී පුහුණුකරු හැඳුනුම්පත ලබාගෙන තිබීම අනිවාර්ය වන බව සඳහන් කරන අතර ඉන් පරිබාහිර පුහුණුකරුවන්ට පුහුණුකරුවකු ලෙස කටයුතු කිරීමට අවස්ථාව හිමිනොවන බවද සඳහන් කරමි. බලපත්‍රලාභී පුහුණුකරු හැඳුනුම්පත නොමැතිව ක්‍රීඩාවක් පුහුණු කිරීම නීති විරෝධී වන අතර ඔවුන්ට විරුද්ධව නීත්‍යානුකූලව ක්‍රියා කරනු ඇත.

04. ඒ අනුව, ඔබ සංගමය/ආයතනය යටතේ කටයුතු කරන පුහුණුකරුවන් මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය දැනුවත් කිරීම් හා මඟපෙන්වීම් සිදුකරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර ඊට අදාළ අයදුම්පත්‍රයද මේ සමඟ ඔබ වෙත යොමු කරමි. මෙම අයදුම්පත්‍රය <u>www.niss.gov.lk</u> වෙබ් අඩවියෙන්ද බාගත කර ගැනීමට හැකියාව පවතී.

එමෙන්ම ක්‍රීඩා පුහුණුකරුවන්ගේ දැඩි හිඟයක් පවතින බැවින් ක්‍රීඩා කර ඇති ප්‍රවීණයන් පුහුණුකරුවන් වශයෙන් පුහුණුකිරීම සඳහා වහාම වැඩපිළිවෙළක් සකස් කොට ක්‍රියාත්මක කරන ලෙසද කාරුණිකව දන්වමි.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය 100/7, නිදහස් මාවත, කොළඹ 07යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය.

**කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර**
ලේකම්

පිටපත්:

1. අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
2. අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යායතනය
3. අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා වෛද්‍ය ආයතනය
4. ගරු ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්

දුරකථනය / தொலைபேசி / Telephone 011-2685390 011-2697934
ෆැක්ස් / தொலைநகல் / Fax 011-2688836
ඊ-තැපැල / மின்னஞ்சல் / E-mail secretary@mos.gov.lk
වෙබ් / இணையதளம் / Web www.mtfes.gov.lk